සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මேல் மாகாணக் கல்வித் திணைக்களம் Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

## භූගෝල විද්‍යාව I

| | | | |
|---|---|---|---|
| (1) නයිට්‍රජන් | (11) නි | (21) නියෝජ්‍ය | (31) 2 |
| (2) නයිල් | (12) නි | (22) ජපානයේ | (32) 1 |
| (3) හියුමස් | (13) වැ | (23) බහුතීරු | (33) 3 |
| (4) මාතලේ | (14) වැ | (24) 1986 | (34) 2 |
| (5) ප්‍රංශය | (15) නි | (25) රබර් | (35) 4 |
| (6) බළංගොඩ | (16) ගල් අඟුරු | (26) පොල් | (36) 1 |
| (7) භූ විෂමතාව | (17) නිවර්තන | (27) 2 | (37) 4 |
| (8) කඳුකර තෙත් | (18) මාලදිවයින | (28) 1 | (38) 3 |
| (9) මොරටුව | (19) අපාඩාවය | (29) 3 | (39) 2 |
| (10) 1km | (20) හෙල්මලු | (30) 4 | (40) 4 |

(ලකුණු 40)

## භූගෝල විද්‍යාව II

(01) (අ) (i) ත්‍රිකෝණමිතික ස්ථානය (ii) අත්හරිනලද වැව

(iii) අඩි පාර (iv) වනාන්තර

(v) ආගමික ස්ථාන :- බෞද්ධ සිද්ධස්ථානය (පන්සල), හින්දු සිද්ධස්ථානය (හින්දු කෝවිල )
රාජ්‍ය ආයතන :- පාසල /උපතැපැල් කාර්යාලය

(vi) පළාත් මායිම. (vii) නිම්නය

(viii) 160 000mn - 210 000mE
160 - 210 ලියා තිබුණත් ලකුණු දෙන්න.

(ix) කඳු බෑවුම් බහලව පිහිටීම, වනාන්තර බහුල වීම ආදී කරුණු 01ක් ලිවීම (ලකුණු 10)

(ආ) (i) A (ii) D (iii) H (iv) M (v) P (ලකුණු 05)

(ඉ) (i)B (ii) F (iii) J (iv) L (v) R (ලකුණු 05)

(02)(i) A මහාද්වීපික කබොල (ග්‍රැනයිට්) B සාගරික කබොල (බැසෝල්ට්) (ලකුණු 02)

(ii) • ශිලා ගෝලයට අයත් ය.
• පෘථිවි ස්කන්ධයෙන් 1 % ක් පමණ වේ.
• ඝනකම ඒකාකාරී නොවේ.
• පාෂාණ (ඛණිජ) වලින් සමන්විතය.
• කබොලේ ඉහළ තුනී ස්තරය පස වන අතර එය ජෛව පරිසරය මගින් නිරතුරුව වර්ධනය වේ.
• කෘෂිකර්ම කටයුතුවලදී මෙම තුනී ස්තරය වැදගත් ය.
  • මහාද්වීපික කබොල ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විතය.
  • සාගරික කබොල බැසෝල්ට් පාෂාණ වලින් සමන්විතය.
  • සියල් ස්ථරය දරාසිටින මූලික පාෂාණ ස්තරය සිමැග් ස්ථරයයි.
  • පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන්වන සීමාව මොහොරොවිසික් අසන්තතිය වේ.
  මින් තුනක් ලිවීම. (ලකුණු 03)

(iii) • සීමාව ඉක්මවා ඛනිජ සම්පත් ගොඩ ගැනීම.
• ගංගාවල වැලි ගොඩ ගැනීම.
• පස් කඳු කපා දැමීම.
• වනාන්තර විනාශ කිරීම.
• කෘෂිකර්මාන්තයේදී සීමාව ඉක්මවා කෘෂි රසායන ද්‍රව්‍ය පොළොවට එකතු කිරීම. ආදීකරුණු තුනක් නම් කර, අනාගත අහිතකර බලපෑම් කෙටියෙන් විස්තර කිරීම. (ලකුණු 05)

(03) (i) (a) කෙන්යාව (b) ආර්ජන්ටිනාව (ලකුණු 05)

(ii) • විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම.
• මුළු මනින්ම ව්‍යාපාරික ස්වරූපයක් ගැනීම.
• දේශීය හා විදේශීය ශ්‍රමය යොදා ගැනීම.
• පුහුණු ශ්‍රමය භාවිතය හා විධිමත් ශ්‍රම සංවිධානය.
• කෘෂිකාර්මික ක්‍රමයක් වුව ද කාර්මික ලක්ෂණද පෙන්නුම් කිරීම.
• විදේශ විනිමය ලබාදෙන අපනයන භෝග වීම.
• බොහෝ රටවල වතු කෘෂිකර්මය විදේශිකයින් විසින් ආරම්භ කර තිබීම.
මින් කරුණු තුනක් ලිවීම (ලකුණු 03)

(iii) (a) • ශ්‍රී ලංකාව සාගරයෙන් වට වූ දූපතක් වීම.
• දිවයින වටා දිගු වෙරළ තීරයක් පැවතීම.
• පුළුල් මහාද්වීපික තටකය.
• බොකු, කලපු හා වරායන් පිහිටා තිබීම.
• ගංගා ඇළ දොළ වැව් හා ජලාශ පැවතීම.
• මෝසම් කාලවල දියවැල් ක්‍රියාකාරිත්වය නිසා මත්ස්‍ය ආහාර බහුල වීම.
මින් දෙකක් ලිවීම.

(b) • ජනතාවට රැකියා අවස්ථා උදා වීම.
• ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ හැකියාව පහසු වීම.
• ධීවර සම්පත් ධීවර ආම්පන්න ආදිය පිටරට යැවීම මගින් විදේශ විනිමය ඉපයීමට හැකි වීම ආදී කරුණු තුනක් ලියා තිබීම. (ලකුණු 05)

(04)(i) ◆ නැව් නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය ලාභදායී ශ්‍රමය හා පුහුණු ශ්‍රමය.

◆ නව තාක්ෂණය

◆ තටාක පහසුකම් සඳහා ජලය නොමිදෙන ගැඹුරු මුහුදු ප්‍රදේශ තිබීම. මින් දෙකක් ලිවීම.

(ලකුණු 02)

(ii) ◆ කාර්මික අමුද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය වෙළෙඳපොළ පුළුල් කිරීමට දරන උත්සාහය නිසා රටවල් අතර ගැටුම් කාරී බව වර්ධනය වීම.

◆ කීර්තිමත් වෙළෙඳ ලාංඡන යටතේ අනුකරණ භාණ්ඩ වෙළෙඳපළට පැමිණීම.

◆ බහුජාතික සමාගම්වල බලපෑම්වලට හසු වීම.

◆ පාරිභෝගික අවශ්‍යතාවලට වඩා ලාභ ඉපැයීමට මුල් තැන දීම.

◆ විද්‍යුත් නිෂ්පාදනවල අධි සංවේදී පද්ධති යලි සකස් කළ නොහැකි වීම නිසා අලුත් වැඩියා කටයුතුවලදී වියදම් අධික වීම.

◆ යුධ අවි නිෂ්පාදනය නිසා ලෝක සාමයට බාධා ඇතිවීම.

◆ කාර්මීකරණයත් සමග සිදුවන නාගරීකරණය නිසා පැල්පත්, මුඩුක්කු වැනි වාසයට නුසුදුසු ජනාවාස බිහිවීම.

◆ අපරාධ හා වංචනික ක්‍රියාවන්ට සමාජ කොටස් පෙළඹීම. මින් කරුණු තුනක් ලිවීම (ලකුණු 03)

(iii)(a) ඉන්දියාව, මාලදිවයින, සිංගප්පූරුව, නෝර්වේ, දකුණු කොරියාව, සීසෙල්ස් දූපත්, මින් රටවල් දෙකක් ලියා තිබීම

(b)ගැටලු -

◆ අමුද්‍රව්‍ය බලශක්තිය හා වෙනත් යෙදවුම් සඳහා පිරිවැය ඉහළ යාම.

◆ බෝට්ටු නිෂ්පාදනයට අවශ්‍ය කොටස් ආනයනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම. ගැටලු එකක් විස්තර කිරීම.

ප්‍රවණතා -

◆ ශ්‍රී ලංකාවේ බෝට්ටුවලට ඇති ඉල්ලුම ක්‍රමිකව ඉහළ යාම.

◆ තාක්ෂණික උපකරණවලින් යුත් ගුණාත්මක බෝට්ටු නිෂ්පාදනය.

◆ විවිධ අවශ්‍යතා සඳහා විවිධ මාදිලියේ බෝට්ටු නිපදවීම. ප්‍රවණතා 01ක් විස්තර කිරීම

● විස්තර කිරීම අවශ්‍යය (ලකුණු 05)

(05) (i) පස, ජලය, හිරුඑළිය, වාතය, වනාන්තර, වෘක්ෂලතා, මින් 02ක් ලිවීම. (ලකුණු 02)

(ii) ◆ ගස් වැඩි ප්‍රමාණයක් කේතු රූපාකාර වේ.

◆ දැඩි සීතලට හා වියළි බවට ඔරොත්තු දෙන සේ ගස් හැඩ ගැසී ඇත.

◆ ඉඳිකටු වැනි ශාක පත්‍ර ඇත.

◆ ශාක සෘජු කඳන් සහිත වන අතර දැව මෘදු වේ.

◆ ඕක්, මේපල්, බීච්, ස්ප්‍රෘස්, ෆාර්, ලාච්, සෙඩාර්, පොප්ලර් වැනි ශාක ඇත. මින් 03ක් ලිවීම. (ලකුණු 03)

(iii)(a) දෙදියගල, කන්නෙලිය, නාකියාදෙනිය, රූහුණු කන්ද, ගිලීමලේ, එරත්න , මොරපිටිය.

(b) ◆ ජාතික රක්ෂිත හා අභය භූමි පවත්වාගෙන යාම.

◆ වන වගා ව්‍යාපෘති ඇති කිරීම.

◆ (සෝල්ට් ක්‍රමය, තෙත් බිම් රැක ගැනීම, කඩොලාන බිම් රැක ගැනිම. මින් 02ක් විස්තර කිරීම (ලකුණු 05)

(06)(i) ◆ දීර්ඝ කාලයක් තිස්සේ මන්දගාමී (සෙමින්) වර්ධනයක් සිදු වූ අවධිය (මානව සංහතිය ආරම්භයේ සිට ක්‍රි.ව. 1750 දක්වා)

◆ කෙටි කාලයක් තුළ ශීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය (ක්‍රි.ව. 1750 සිට ) (ලකුණු 02)

(ii) ◆ විවිධ කර්මාන්ත ස්ථානගත වීම.

◆ නාගරීකරණය

◆ වෙළඳ මධ්‍යස්ථාන හා වරාය පිහිටීම.

◆ යටිතල පහසුකම් වර්ධනය.

◆ විවිධ සේවාවන් ඒක රාශී වී තිබීම.

◆ පරිපාලන කටයුතු ස්ථානගත වීම. මෙවැනි මානුෂ සාධක 03ක් ලිවීම. (ලකුණු 03)

(iii) ◆ බාල වයස් කාණ්ඩවලට අයත් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වීම.

◆ වියපත් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීම

◆ ස්ත්‍රී ප්‍රතිශතය වැඩිවීම මෙවැනි ලක්ෂණ දෙකක් ලිවීම සහ බාලවයස් කාණ්ඩ අඩු වීම අනාගත ශ්‍රම බලකාය අඩුවීමට බලපෑ හැකි බව. වියපත් සංඛ්‍යාව වැඩි වීම නිසා යැපෙන්නන් සංඛ්‍යාව වැඩිවිය හැකිබව. ආදී කරුණු ඇතුලත් කෙටි විස්තරයක් ලිවීම. (ලකුණු 05)

(07) (i) භෞතික ජීවන තත්ව දර්ශකය, මානුෂ සංවර්ධන දර්ශකය, මානුෂ දරිද්‍රතාදර්ශකය, මානුෂ පීඩක දර්ශකය මින් දෙකක් ලිවීම (ලකුණු 02)

(ii) පරිසර දූෂණය, දේශගුණ විපර්යාස, ජෛව සම්පතට හානි සිදුවීම, ඕසෝන් වියනට හානි සිදු වීම, ස්වභාවික විපත් වැඩිවීම, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම ආදී කරුණු 03ක් ලිවීම (ලකුණු 03)

(iii)(a) ◆ විදුලි සංදේශ කොමිෂන් සභාව මගින් ලබාදෙන පහසුකම්

◆ නැණසල මධ්‍යස්ථාන සහ ඊ ලංකා වැඩපිළිවෙළ මගින් සේවා පහසුකම්

◆ 2013 වසරේ සිට ක්‍රියාත්මක වන අ.පො.ස. උ.පෙළ තාක්ෂණ විෂය ධාරාව.

◆ විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගින් ලබාදෙන උසස් අධ්‍යාපන අවස්ථා.

◆ පාසල් පද්ධතියට තොරතුරු හා සන්නිවේදන ඒකක හා අන්තර්ජාල පහසුකම්.

◆ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතන.

◆ තරඟකාරී පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන. මින් ක්‍රියාමාර්ග 02ක් ලිවීම.

(b) ◆ රටේ අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා වැඩි දියුණු වීම.

◆ අධ්‍යාපනය සඳහා නව මං පෙත් හෙළිකර දීම.

◆ ඍජු හා වක්‍ර රැකියා අවස්ථාවන් ඇති වීම.

◆ සාමාන්‍ය ජනතාවගේ දැනුම පුළුල් කර ගැනීම සහ සේවා අවශ්‍යතා සපුරා ගැනීමේ අවස්ථා පුළුල් වීම.

◆ නායයෑම් සුනාමි ආදී ආපදා අවස්ථාවලදී කඩිනමින් දායක වීමේ අවස්ථා සැලසීම.

◆ විද්‍යුත් මූල්‍ය සේවාවන් මගින් ගනුදෙනු ඉක්මන් වීම හා සුරක්ෂිත වීම. මෙවැනි පහසුකම් තුනක් ලිවීම. (ලකුණු 05)

(08) (i) කාබන්ඩයොක්සයිඩ්, මීතේන්, නයිට්‍රජන් ඔක්සයිඩ්, ක්ලෝරොෆ්ලෝරො කාබන්. මින් දෙකක් ලිවීම (ලකුණු 02)

(ii) ◆ දේශගුණික වෙනස්කම් ඇති වීම.
- ධ්‍රැවීය අයිස් නිධි දියවී මුහුදු මට්ටම ඉහළ යාම.
- කලපු විනාශ වීම හා ජලය ලවණීකරණය වීම.
- සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වී ජලජ ජීවීන් විනාශ වීම.
- සාගර මතුපිට උෂ්ණත්වය වැඩිවීම නිසා සුළි කුණාටු තත්වයන් ඇති වීම
- දේශගුණ මායිම් කලාප වෙනස්වීම.
- ඇතැම් ජීවීන් වඳ වීම හා නව ගහන බිහිවීම
- සත්ත්ව ජාන විනාශ වීම හා විකෘති වීම.
- භෝග විනාශය හා අස්වැන්න අඩුවීම.
- සත්ත්ව අභිජනනීය කලාප වෙනස්වීම
- පානීය ජල මූලාශ්‍ර දූෂණයට ලක්වීම. මින් කරුණු 03ක් ලිවීම (ලකුණු 03)

(iii)ජල ගැලීම් ආපදාව අවම කර ගැනීමට ගත හැකි පහත ක්‍රියාමාර්ග දෙකක් විස්තර කිරීම.
- ගංගා පෝෂක ප්‍රදේශවල වනාන්තර ආරක්ෂා කර ගැනීම.
- ගංගාවල මෝය විවෘතව තබා ගැනිම.
- පහත් බිම් හා තෙත් බිම් ආරක්ෂා කර ගැනීම.
- ගංගාවල වැලි ගොඩ දැමීම සීමා කිරීම.
- ජල ගැලීම්වලට ඔරොත්තු දෙන ඉදි කිරීම්වලට යොමු වීම.
- පිටාර ගැලීම් සිදුවන ස්ථානවල මානව කටයුතු සීමා කිරීම.
- ආරක්ෂිත ක්‍රියා මාර්ග ගැනීම හා ප්‍රජාව දැනුවත් කිරීම. (ක්‍රියාමාර්ග දෙකක් විස්තර කිරීම සඳහා ලකුණු 03යි)

(ලකුණු 03 + 02 = 05)